# ඇබෑර්තු

# ඒකාබද්ධ ජලාධාර හා
# ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

IWWRMP

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

2019.03.15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 01/2019 දරන චක්‍රලේඛය ප්‍රකාරව සහ රජයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව පහත සඳහන් තනතුරු සඳහා "කොන්ත්‍රාත් පදනම" මත පූර්ණකාලීන සේවය සඳහා ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

තනතුරු සඳහා වැටුප් අංක 1/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD)චක්‍රලේඛයේ 03 වන වගුවේ 03 වන තීරුවේ සඳහන් කොට ඇත.

අයදුම්කරුවන් වයස අවුරුදු 62ට අඩු විය යුතු අතර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව මෙන්ම රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුකම සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවන් වේ. විදෙස් අරමුදල් සපයන ලද ව්‍යාපෘතිවල ශ්‍රී ලංකාවේ වැඩ පළපුරුද්ද වැඩි වාසියක් ලෙස සැලකේ.

| අංකය | PS කාණ්ඩය | තනතුර | ඇබෑර්තු සංඛ්‍යාව | අදාළ වන චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 4 A | ඉංජිනේරු (ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවයන් දෙනු ඇත) | 2 | MSD චක්‍රලේඛ අංක 01/2019 |
| 02 | PS 4B | ඉංජිනේරු (ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවයන් දෙනු ඇත) | 1 | |
| 03 | | රියැදුරන් (බර වාහන පැදවීමේ බලපත්‍රය සමග වසර 5ක පළපුරුද්ද) | 2 | |

ජීව දත්ත සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළත් අයදුම්පත්, මූලික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර 2025 දෙසැම්බර් 04වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. රාජ්‍ය සේවයේ / පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවන්හි/ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි / පූර්ණව රජය සතු සමාගම් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

තවද, එම අයදුම්පත ඊමේල් ශීර්ෂය තීරුවේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර **ao.iwwrmp@gmail.com** යන ඊමේල් ලිපිනය වෙත යොමු කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කරනු ලබන අතර, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කුමන ආකාරයක හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP),**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07,**
**දුරකථන අංක : 011 2691163**
**වෙබ් අඩවිය : www.iwwrmp.lk**